**පාඨමාලා සංකේතය :** PALIE1025

**ඒකක වර්ගය :** C

**මාතෘකාව :** මූලාශ්‍රය පරිචය හා සාහිත්‍ය විචාරය

**අරමුණු හා අභිමතාර්ථ:**

පාලි සාහිත්‍යය අධ්‍යයනය කිරීමේදී වැදගත්
වන ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රයයන් පිළිබඳ පහත සඳහන් මාතෘකා ඇසුරෙන්ප්‍රමාණවත් අධ්‍යයනයක් කිරීම මෙහිදී අපේක්ෂිතය.සාහිත්‍ය විචාරය යටතේ සාම්ප්‍රදායික හා නූතන සාහිත්‍යවිචාර න්‍යාය පිළිබඳ හැඳින්වීමක් ලබාදීමට අපේක්ෂිත අතරඊට පදනමක් ලෙස පිටකාගත එබඳු න්‍යාය පිළිබඳ ගැඹුරින් හැදෑරීමත් ඒවා පසුකාලීන පාලි හා සිංහල සාහිත්‍යය විෂයෙහි බලපෑ ආකාරයත් අධ්‍යයනය කෙරේ.

**ඉගෙනුම් ඵල :**

පාලි සාහිත්‍යාරම්භය, පෝෂණය සහ විකාශය සනිටුහන් කරන මූලාශ්‍රය ග්‍රන්ථ පිළිබඳ මනා අවබෝධයක් ලබන අතර ආචාර සම්පන්න මනෝභාවයන් උද්දීපනය කිරිමෙහිලා සාහිත්‍ය විචාරය උපයෝගී කොටගන්නා අයුරු පෙන්වා දෙයි.

**අන්තර්ගතය:**

- **මූලාශ්‍රය අධ්‍යයනය :**

පාලි ග්‍රන්ථවලට සපයා ඇති පැරණි
සිංහල සන්න, ගැටපද හා පරිකථා
සාහිත්‍යය, බෞද්ධ සංස්කෘත ග්‍රන්ථ
හා පාලි සාහිත්‍යයට ඒවායෙහි ඇති
සම්බන්ධය, පාලි ග්‍රන්ථයන්හි
පරිවර්තන, පාලියට සම්බන්ධ
ප්‍රාකෘත ලේඛන හා ග්‍රන්ථ, රෝමන්
අක්ෂර මාලාව හා ඉංග්‍රීසි භාෂාව
ඇසුරින් සැකසුණු පාලි ග්‍රන්ථවල
විවිධ සංස්කරණ හා පරිවර්තන,
අමුද්‍රිත පාලි තල්කොළ පිටපත් හා
මුද්‍රිත සිංහල සංස්කරණ,පාලි
භාෂාවෙන් රචිත ශිලාලේඛන
හා සන්දේශ පිළිබඳ අවබෝධය.

**සාහිත්‍ය විචාරය :** සුබෝධාලංකාර හා වුත්තෝදය ඇසුරින් පාලි ඡන්දෝලංකාර, නූතන නවකථා, කෙටිකතා, කාව්‍ය හා නාට්‍ය විචාරය පිළිබඳ සාමාන්‍ය දැනුමක්,සූත්‍රපිටකය ඇසුරින් භාෂාව හා එහි භාවිතය පිළිබඳ සංකල්පය, සූත්‍ර පිටකයේ කාව්‍යමය ප්‍රකාශන, පාලි කාව්‍ය නිර්මාණයන්හි විකාශය, සිංහල සාහිත්‍යයේ සංවර්ධනය විෂයෙහි පාලියේ බලපෑම.

**ඉගෙනුම් ක්‍රමවේදය :**

අත් පත්‍රිකා, අධ්‍යයන මාර්ගෝපදේශන හා සම්මන්ත්‍රණ

**ඇගයීම් ක්‍රමය:** වර්ෂාවසානයේදී පැවැත්වෙන පැය 03කලිඛිත පරීක්ෂණය.

**නිර්දේශිත කියවීම්:**


බුද්ධදත්ත හිමි, පොල්වත්තේ. (1966). *පාලි සාහිත්‍යය*. කොළඹ: ස්වභාෂා මුද්‍රණය.

සන්නස්ගල, පුංචිබණ්ඩාර. (1961). *සිංහල සාහිත්‍ය වංශය*. කොළඹ: ලේක්හවුස් මුද්‍රණය.

විමලවංශ හිමි, බද්දේගම. (1955). *බෞද්ධ සාහිත්‍යය*. මරදාන: අනුල මුද්‍රණාලය.

ගමගේ, අරුණ, කේ. (2012). මහානාගකුල සන්දේශ. මරදාන: ගොඩගේ ප්‍රකාශකයෝ.

Geiger, W. Tr. B. Ghosh. (1968). *Pali Literature and Language*. Delhi.

Hazra Kanai Lal. (1998). *Pali Language and Literature*. (Vol. 1, 11) D.K.Printworld, Delhi.

Warder, A.K. (1963). *Introduction to Pali*. P.T.S., London.